# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1989/61 - 2016 ඔක්තෝබර් මස 21 වැනි සිකුරාදා - 2016.10.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2016

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වැනි වගන්තිය සමග කියවිය යුතු 142 වැනි වගන්තිය යටතේ, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2016 අංක 2 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි (මිල ඉහළ සීමා) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) අති විශෙෂ ගැසට් පත්‍රයේ මෙම නියෝග පළකරනු ලැබීමේ දින සිට බලාත්මක විය යුතු (මෙහි මින් මතු "උපලේඛනගත ඖෂධ" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඖෂධ සඳහා මිල සූත්‍රය මත ඉහළ සීමාවක් පැවතිය යුත්තේ ය.

3. උපලේඛනගත ඖෂධ පිළිබඳවන මිල ඉහළ සීමාවන් එම ඖෂධවල සියලු වෙළඳ නාමයන් සහ ඖෂධීය නාමයන් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

4. අදාළ දිනයේ සිට හා එදිනට පසුව කිසිදු නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දකු හෝ ඖෂධවේදියකු විසින් මෙහි උපලේඛනයේ II වන තීරුවේ දක්වා ඇති කිසිදු උපලේඛනගත ඖෂධයක් එහි V වන තීරුවේ අනුරූපී සටහනේ දක්වා ඇති උපරිම සිල්ලර මිලට (MRP) වඩා වැඩි මිලකට අලෙවි නොකළ යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට වඩා අඩු යම් මිලකට යම් උපලේඛනගත ඖෂධයක් යම් නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දකු හෝ ඖෂධවේදියකු විසින් වර්තමානයේ දී විකුණනු ලබන විට ඔහු විසින් එහි මිල වැඩි කිරීමෙන් තොරව එහි පවත්නා මිල අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු ය.

6. නිෂ්පාදිත හෝ අදාළ දිනයේ දී වෙළඳපලේ හෝ ඔසුසලේ විකිණීමට තිබෙන උපලේඛන ගත ඖෂධ තොගයේ අයිතමවල එක් එක් ඒකකයේ වර්තමාන සිල්ලර මිල හෝ මෙහි උපලේඛනයේ දක්වා ඇති අදාළ උපරිම සිල්ලර මිල යන දෙකෙන් වඩාත් අඩු මිල ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින්, එසේවුව ද අදාළ දිනයේ සිට දින හතළිස් පහක කාල සීමාවක් ඉකුත් වීමට පෙර අදාළ වෙළඳ ඇසුරුමේ හෝ ලේබලයේ මුද්‍රණය හෝ සළකුණු කළ යුතු ය.

7. ඉහත 6 වන නියෝගයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අදාළ දිනයේ සිට සහ එදිනට පසුව එක් එක් ඒකකයේ උපරිම සිල්ලර මිල උපලේඛනයේ දක්වා ඇති පරිදි විය යුතු ය. උපලේඛනයේ දක්වා ඇති උපරිම සිල්ලර මිල කලින් ප්‍රතිශෝධනය කරනු ලැබුවහොත් මිස අදාළ දිනයේ සිට අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා වලංගුව සහ බලාත්මකව පැවතිය යුතු ය.

8. මෙම නියෝග ක්‍රියාත්මක කිරීම ජාතික ඖෂධ නියාමන අධිකාරියේ, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ හා පාරිභෝගික කටයුතු අධිකාරියේ වගකීම විය යුතු ය.

9. මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දකු හෝ ඖෂධවේදියකු විසින් වරදක් සිදු කරනු ලබන අතර 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 132 වැනි වගන්තිය යටතේ ඔහුට එරෙහිව නඩු පැවරිය යුතු ය.

10. මෙහි උපලේඛනයේ දක්වා ඇති උපලේඛනගත ඖෂධවල උපරිම සිල්ලර මිල සෑම සිල්ලර අලෙවිසලකම ප්‍රදර්ශනය කිරීම සෑම නිෂ්පාදකයකු, වෙළෙන්දකු, ආනයනකරුවකු හෝ ඖෂධවේදියකුගේම වගකීම විය යුතු ය.

**උපලේඛනය**

***තෝරා ගත් ඖෂධීය නිෂ්පාදන 48 ක උපරිම සිල්ලර මිල***

| *I වැනි තීරුව* | *II වැනි තීරුව ඖෂධීය නාමය* | *III වැනි තීරුව ලබා ගනු ලබන ක්‍රමය/ මාත්‍රා ආකාරය* | *IV වැනි තීරුව ප්‍රමාණය* | *V වැනි තීරුව උපරිම මිල/ (ශ්‍රී ලංකා රුපියල්)* |
|---|---|---|---|---|
| 1 | ඇල්බෙන්ඩසෝල් | පෙති | 400 මි.ග්‍රෑ. | 30.00 |
| | | | | |
| 2 | ඇමොක්සිලීන් - ක්ලැවුලිනික්ඇසිඩ් | මුඛ මාර්ගයෙන් දියර වශයෙන් ලබා ගැනීම | 156 මි.ග්‍රෑ./ 5 මි.ලි. | 287.50 |
| | ඇමොක්සිලීන් - ක්ලැවුලිනික්ඇසිඩ් | පෙති | 375 මි.ග්‍රෑ. | 35.40 |
| | ඇමොක්සිලීන් - ක්ලැවුලිනික්ඇසිඩ් | පෙති | 625 මි.ග්‍රෑ. | 60.00 |
| | ඇමොක්සිලීන් - ක්ලැවුලිනික්ඇසිඩ් | එන්නත් | 1.2 ග්‍රෑ. | 631.00 |
| | | | | |
| 3 | කැලැරිත්‍රෝමයිසීන් | පෙති | 250 මි.ග්‍රෑ. | 36.50 |
| | කැලැරිත්‍රෝමයිසීන් | පෙති | 500 මි.ග්‍රෑ. | 74.00 |
| | කැලැරිත්‍රෝමයිසීන් | මුඛ මාර්ගයෙන් දියර වශයෙන් ලබා ගැනීම | 125 මි.ග්‍රෑ. /5 මි.ලි. | 436.00 |
| | | | | |
| 4 | ඇසිත්‍රෝමයිසීන් | පෙති | 250 මි.ග්‍රෑ. | 37.60 |
| | ඇසිත්‍රෝමයිසීන් | පෙති | 500 මි.ග්‍රෑ. | 52.75 |
| | ඇසිත්‍රෝමයිසීන් | මුඛ මාර්ගයෙන් දියර වශයෙන් ලබා ගැනීම | 200 මි.ග්‍රෑ. /5 මි.ලි. | 175.00 |
| | | | | |
| 5 | සෙෆයුරොක්සිම් | පෙති | 250 මි.ග්‍රෑ. | 45.50 |
| | සෙෆයුරොක්සිම් | පෙති | 500 මි.ග්‍රෑ. | 72.60 |
| | | | | |
| 6 | ඩොක්සිසයික්ලීන් | පෙති | 100 මි.ග්‍රෑ. | 10.10 |
| | | | | |
| 7 | ඇසික්ලොවීර් | පෙති | 200 මි.ග්‍රෑ. | 37.00 |
| | | | | |
| 8 | සිප්රොෆ්ලොක්සසීන් | පෙති | 250 මි.ග්‍රෑ. | 5.75 |
| | සිප්රොෆ්ලොක්සසීන් | පෙති | 500 මි.ග්‍රෑ. | 8.50 |

| I වැනි තීරුව | II වැනි තීරුව ඖෂධීය නාමය | III වැනි තීරුව ලබා ගනු ලබන ක්‍රමය/ මාත්‍රා ආකාරය | IV වැනි තීරුව ප්‍රමාණය | V වැනි තීරුව උපරිම මිල/ (ශ්‍රී ලංකා රුපියල්) |
|---|---|---|---|---|
| 9 | ලෙවෝෆ්ලොක්සසීන් | පෙති | 250 මි.ග්‍රෑ. | 24.20 |
| | ලෙවෝෆ්ලොක්සසීන් | පෙති | 500 මි.ග්‍රෑ. | 40.00 |
| | | | | |
| 10 | සෙපලෙක්සින් | කරල් | 250 මි.ග්‍රෑ. | 8.20 |
| | සෙපලෙක්සින් | කරල් | 500 මි.ග්‍රෑ. | 15.00 |
| | සෙපලෙක්සින් | මුඛ මාර්ගයෙන් දියර වශයෙන් ලබා ගැනීම | 125 මි.ග්‍රෑ. /5 මි.ලි. | 265.00 |
| | | | | |
| 11 | සෙෆික්සිම් | කරල් | 100 මි.ග්‍රෑ. | 23.00 |
| | සෙෆික්සිම් | කරල් | 200 මි.ග්‍රෑ. | 42.70 |
| | සෙෆික්සිම් | මුඛ මාර්ගයෙන් දියර වශයෙන් ලබා ගැනීම | 50 මි.ග්‍රෑ. /5 මි.ලි. | 345.00 |
| | | | | |
| 12 | ඇම්ලොඩිපින් | පෙති | 5 මි.ග්‍රෑ. | 15.30 |
| | ඇම්ලොඩිපින් | පෙති | 10 මි.ග්‍රෑ. | 21.30 |
| | | | | |
| 13 | ඩිල්ටියසම් | පෙති | 30 මි.ග්‍රෑ. | 2.70 |
| | ඩිල්ටියසම් | පෙති | 60 මි.ග්‍රෑ. | 8.90 |
| | ඩිල්ටියසම් | පෙති | 90 මි.ග්‍රෑ. | 21.40 |
| | | | | |
| 14 | ලොසාටන් පොටැසියම් | පෙති | 25 මි.ග්‍රෑ. | 7.35 |
| | ලොසාටන් පොටැසියම් | පෙති | 50 මි.ග්‍රෑ. | 10.30 |
| | | | | |
| 15 | ලොසාටන්+ එච්සීටී | පෙති | 62.5 මි.ග්‍රෑ. | 19.45 |
| | | | | |
| 16 | එනලප්‍රිල් | පෙති | 5 මි.ග්‍රෑ. | 6.00 |
| | එනලප්‍රිල් | පෙති | 10 මි.ග්‍රෑ. | 10.10 |
| | | | | |
| 17 | ඇටනොලෝල් | පෙති | 25 මි.ග්‍රෑ. | 3.00 |
| | ඇටනොලෝල් | පෙති | 50 මි.ග්‍රෑ. | 4.40 |
| | ඇටනොලෝල් | පෙති | 100 මි.ග්‍රෑ. | 13.00 |
| | | | | |
| 18 | නිෆෙඩිපින්- දීර්ඝ ක්‍රියාකාරිත්වයක් සහිත | පෙති හෝ කරල් | 20 මි.ග්‍රෑ. | 3.70 |
| | | | | |
| 19 | ක්ලෝපිඩොග්‍රෙල් | පෙති | 75 මි.ග්‍රෑ. | 17.50 |
| | | | | |
| 20 | ඇටෝවාස්ටැටින් | පෙති | 10 මි.ග්‍රෑ. | 11.15 |
| | ඇටෝවාස්ටැටින් | පෙති | 20 මි.ග්‍රෑ. | 17.60 |
| | | | | |
| 21 | රොසුවාස්ටැටින් | පෙති | 5 මි.ග්‍රෑ. | 21.50 |
| | රොසුවාස්ටැටින් | පෙති | 10 මි.ග්‍රෑ. | 37.00 |
| | | | | |
| 22 | ටෙල්මිසාටන් | පෙති | 20 මි.ග්‍රෑ. | 10.20 |
| | ටෙල්මිසාටන් | පෙති | 40 මි.ග්‍රෑ. | 16.20 |
| | ටෙල්මිසාටන් | පෙති | 80 මි.ග්‍රෑ. | 30.40 |
| | | | | |
| 23 | ඇස්පිරින් | පෙති | 75 මි.ග්‍රෑ. | 3.00 |
| | ඇස්පිරින් | පෙති | 100 මි.ග්‍රෑ. | 5.30 |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව*<br>*ඖෂධීය නාමය* | *III වැනි තීරුව*<br>*ලබා ගනු ලබන ක්‍රමය/ මාත්‍රා ආකාරය* | *IV වැනි තීරුව*<br>*ප්‍රමාණය* | *V වැනි තීරුව*<br>*උපරිම මිල/*<br>*(ශ්‍රී ලංකා රුපියල්)* |
|---|---|---|---|---|
| 24 | මෙට්පෝමින් | පෙති | 500 මි.ග්‍රෑ. | 3.95 |
| | මෙට්පෝමින් - දීර්ඝ ක්‍රියාකාරිත්වයක් සහිත | පෙති හෝ කරල් | 500 මි.ග්‍රෑ. | 7.70 |
| | මෙට්පෝමින් | පෙති | 850 මි.ග්‍රෑ. | 7.40 |
| | | | | |
| 25 | ග්ලිබෙන්ක්ලමයිඩ් | පෙති | 5 මි.ග්‍රෑ. | 2.20 |
| | | | | |
| 26 | ග්ලයිකසයිඩ් | පෙති | 80 මි.ග්‍රෑ. | 11.30 |
| | | | | |
| 27 | තයිරොක්සින් | පෙති | 50 මයික්‍රෝ ග්‍රෑ. | 6.10 |
| | තයිරොක්සින් | පෙති | 100 මයික්‍රෝ ග්‍රෑ. | 9.10 |
| | | | | |
| 28 | ග්ලිපිසයිඩ් | පෙති | 5 මි.ග්‍රෑ. | 7.90 |
| | | | | |
| 29 | ඉබියුප්‍රොෆෙන් | පෙති හෝ කරල් | 200 මි.ග්‍රෑ. | 1.10 |
| | ඉබියුප්‍රොෆෙන් | පෙති හෝ කරල් | 400 මි.ග්‍රෑ. | 3.70 |
| | | | | |
| 30 | ඩයික්ලොෆෙනැක්සෝඩියම් | පෙති | 50 මි.ග්‍රෑ. | 13.00 |
| | ඩයික්ලොෆෙනැක්සෝඩියම් | පෙති | 100 මි.ග්‍රෑ. | 15.10 |
| | | | | |
| 31 | ඩයික්ලොෆෙනැක්පොටැසියම් | පෙති | 50 මි.ග්‍රෑ. | 10.95 |
| | | | | |
| 32 | පැරසිටමෝල් | පෙති | 500 මි.ග්‍රෑ. | 1.30 |
| | | | | |
| 33 | සෝඩියම්වැල්ප්‍රොඒට් | පෙති | 200 මි.ග්‍රෑ. | 9.00 |
| | | | | |
| 34 | රිස්පෙරිඩොන් | පෙති | 1 මි.ග්‍රෑ. | 7.90 |
| | රිස්පෙරිඩොන් | පෙති | 2 මි.ග්‍රෑ. | 9.25 |
| | | | | |
| 35 | ඔලන්සපින් | පෙති | 5 මි.ග්‍රෑ. | 10.00 |
| | ඔලන්සපින් | පෙති | 10 මි.ග්‍රෑ. | 20.80 |
| | | | | |
| 36 | කාබමසපින් | පෙති | 200 මි.ග්‍රෑ. | 12.00 |
| | | | | |
| 37 | ඇල්ප්‍රසෝලැම් | පෙති | 0.25 මි.ග්‍රෑ. | 6.50 |
| | ඇල්ප්‍රසෝලැම් | පෙති | 0.5 මි.ග්‍රෑ. | 9.90 |
| | | | | |
| 38 | ෆ්ලුඔක්සටින් | පෙති | 20 මි.ග්‍රෑ. | 11.00 |
| | | | | |
| 39 | ගැබාපෙන්ටින් | පෙති | 100 මි.ග්‍රෑ. | 16.75 |
| | ගැබාපෙන්ටින් | පෙති | 300 මි.ග්‍රෑ. | 33.15 |
| | | | | |
| 40 | බෙක්ලොමෙතසෝන් | ඩීපීකරල් (ආශ්වාස කිරීම) | 200 මයික්‍රෝ ග්‍රෑ. | 6.00 |
| | බෙක්ලොමෙතසෝන් | ඩීපීකරල් (ආශ්වාස කිරීම) | 400 මයික්‍රෝ ග්‍රෑ. | 6.80 |
| | බෙක්ලොමෙතසෝන් | මීටර් මාත්‍රා ආශ්වාස උපකරණය (මාත්‍රා 200) | 100 මයික්‍රෝ ග්‍රෑ. | 507.50 |
| | බෙක්ලොමෙතසෝන් | මීටර් මාත්‍රා ආශ්වාස උපකරණය (මාත්‍රා 200) | 250 මයික්‍රෝ ග්‍රෑ. | 561.00 |
| | | | | |
| 41 | සැල්බියුටමෝල් | ඩීපීකරල් (ආශ්වාස කිරීම) | 200 මයික්‍රෝ ග්‍රෑ. | 4.00 |
| | සැල්බියුටමෝල් | ඩීපීකරල් (ආශ්වාස කිරීම) | 400 මයික්‍රෝ ග්‍රෑ. | 5.50 |
| | සැල්බියුටමෝල් | මීටර් මාත්‍රා ආශ්වාස උපකරණය (මාත්‍රා 200) | 100 මයික්‍රෝ ග්‍රෑ. | 310.00 |

| I වැනි තීරුව | II වැනි තීරුව ඖෂධීය නාමය | III වැනි තීරුව ලබා ගනු ලබන ක්‍රමය/ මාත්‍රා ආකාරය | IV වැනි තීරුව ප්‍රමාණය | V වැනි තීරුව උපරිම මිල/ (ශ්‍රී ලංකා රුපියල්) |
|---|---|---|---|---|
| 42 | මීතයිල්ප්‍රෙඩ්නිසෝලෝන් | පෙති | 4 මි.ග්‍රෑ. | 11.85 |
| | මීතයිල්ප්‍රෙඩ්නිසෝලෝන් | පෙති | 16 මි.ග්‍රෑ. | 41.00 |
| | | | | |
| 43 | ඔමෙප්‍රසෝල් | පෙති | 20 මි.ග්‍රෑ. | 4.50 |
| | | | | |
| 44 | පැන්ටොප්‍රසෝල් | පෙති | 20 මි.ග්‍රෑ. | 17.00 |
| | පැන්ටොප්‍රසෝල් | පෙති | 40 මි.ග්‍රෑ. | 28.00 |
| | | | | |
| 45 | ඉසොමෙප්‍රසෝල් | පෙති | 20 මි.ග්‍රෑ. | 20.20 |
| | ඉසොමෙප්‍රසෝල් | පෙති | 40 මි.ග්‍රෑ. | 38.40 |
| | | | | |
| 46 | ඩොම්පෙරිඩෝන් | පෙති | 10 මි.ග්‍රෑ. | 5.40 |
| | | | | |
| 47 | රැබිප්‍රසෝල් | පෙති | 10 මි.ග්‍රෑ. | 11.30 |
| | රැබිප්‍රසෝල් | පෙති | 20 මි.ග්‍රෑ. | 21.55 |
| | | | | |
| 48 | ඇලෙන්ඩ්‍රොනික් ඇසිඩ් | පෙති | 70 මි.ග්‍රෑ. | 101.40 |

10 - 301

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.